**<u>2025.07.08 දින පෙ.ව. 09.30 ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල රැස්වීම් ශාලාවේදී පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2025 ජූලි මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.</u>**

සහභාගිත්වය :-

1. ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා - ගරු උප සභාපති
3. කේ. ඩී. මිගාර නේමින්ද වළල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
4. පී. ලෙනිකා දූශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රිනී
5. ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා - ගරු මන්ත්‍රී
6. ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා - ගරු මන්ත්‍රී
7. ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
8. උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී
9. ඩී. ඩී. නදීශාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
10. එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා - ගරු මන්ත්‍රී
11. එම්. නිශාන්ත කුමාර මැතිතුමා - ගරු මන්ත්‍රී
12. එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා - ගරු මන්ත්‍රී
13. සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා - ගරු මන්ත්‍රී
14. ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා - ගරු මන්ත්‍රී
15. කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
16. ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා - ගරු මන්ත්‍රී
17. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
18. ලියනගමගේ අභයරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
19. එච්. තිලක් උපුල් චමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී
20. යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය - ගරු මන්ත්‍රිනී
21. ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා - ගරු මන්ත්‍රී
22. බී. සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා - ගරු මන්ත්‍රී
23. ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 9.30 ට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ගරු උප සභාපතිතුමා ඇතුළු සියලු ගරු මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වයෙන් යුතුව සභාවේ කටයුතු ආරම්භ විය.

**<u>ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු සියලු සභිකවරු, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරීතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ද, මාධ්‍යවේදී මහත්වරුන් ද සාදරයෙන් පිළිගන්නා ලදී.

**(අ). <u>පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම</u> :-** නැත

**(ආ). <u>ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ නිවේදන</u> :-**

(ආ)(1). සභාවේ ලේකම්තුමිය මේ වන විට හදිසි අනතුරකට ලක්ව, වෛද්‍ය නිවාඩු ලබා ඇත. ඒ නිසා අද දින සභාවේ ලේකම් ධුරයේ රාජකාරී ආවරණය කිරීම සඳහා මාගේ බලය පැවරීම මත, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී ටී. ජී. ගීතිකා ලක්මාලි මහත්මිය සභාවේ ලේකම් ධුරයේ රාජකාරී සිදු කරන බවට ගරු සභාවට නිවේදනය කරමි.

(ආ)(2). "ඉන්ධන දීමනාව ඉල්ලුම් කරන වාහන පිළිබඳ අනන්‍යතාවය තහවුරු කර ගැනීම" සම්බන්ධව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට නිවේදනය කරන ලදී. ඒ අනුව,

- බෙන්තොට ප්‍රාදේශීය සභාව වෙත අභිනවයෙන් තේරී පත් වී ඇති ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරුන් සඳහා මාසික ඉන්ධන දීමනාව ලබා දීමට අදාළව ඉන්ධන දීමනා ලබා ගැනීමට අපේක්ෂිත වාහනයේ පහත සඳහන් ලියවිලි කාර්යාලයේ විෂය නිලධාරී වෙත ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාවට දැනුම් දෙන ලදී.
    - i. වාහනයේ ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක්.
    - ii. වාහනයේ වාර්ෂික ආදායම් බලපත්‍රයේ සහතික කළ පිටපතක්.
    - iii. වාහනයේ වලංගු රක්ෂණාවරණ සහතිකයේ සහතික කළ පිටපතක්.
    - iv. භාවිත කරනු ලබන වාහනය ගරු මන්ත්‍රීවරුන්ට අයත් නොවන විට එම වාහනය භාවිත කිරීම සඳහා අවසර දෙමින් අදාළ වාහනයේ හිමිකරු විසින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශය.

(ආ)(3). "ඉන්ධන දීමනා හා මන්ත්‍රී දීමනා ලබා ගැනීම සම්බන්ධව" ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් පහත නිවේදනය සිදු කරන ලදී.

- මාසික ඉන්ධන දීමනා ලබා ගැනීම සඳහා අදාළ බිල්පත් ඊළඟ මාසික මහ සභා රැස්වීම පැවැත්වීමට සති 02 කට පෙර අදාළ විෂයභාර නිලධාරී වෙත ඉදිරිපත් කරන ලෙස ද මාසික මහ සභා රැස්වීමට ගරු මන්ත්‍රීවරුන් සහභාගී නොවුණහොත් එම මසට අදාළ මන්ත්‍රී දීමනා ලබා ගැනීමට වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර එම වාර්තාව ද ඊළඟ මාසික මහ සභා රැස්වීම පැවැත්වීමට සති 02 කට පෙර අදාළ විෂය භාර නිලධාරී වෙත ඉදිරිපත් කරන ලෙස ද ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් දැනුම් දෙන ලදී.

(ආ)(4). "2025 ii වන අර්ධ වර්ෂය සඳහා පුහුණු ලාභීන් ප්‍රාදේශීය මට්ටමින් බඳවා ගැනීම සඳහා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ සහය ලබා ගැනීම - ගාල්ල දිස්ත්‍රික්කය" යන මැයෙන් යුතුව එවා ඇති මගේ අංක VTA/GD/CG/S-Pro/2025 හා 2025.06.16 දිනැති ලිපිය ගරු මන්ත්‍රීවරුන්ගේ දැනගැනීම සඳහා නිවේදනය කරන ලදී.

(ආ)(5). <u>වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දීම සම්බන්ධවයි.</u>
1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ පනත ඉවත් කර ඒ වෙනුවට 2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනත බලාත්මක කර ඇත.
මහජන නියෝජිතයින් විසින් ඒ අනුව සිය ධුරයට පත් වී මාස 03 ක් තුළ සිය වත්කම් හා බැරකම් ප්‍රකාශයන් අදාළ ආකෘතියෙන් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුව ඇත.
ඒ අනුව අප ප්‍රාදේශීය සභාවේ සියලු මන්ත්‍රීවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ සම්පූර්ණ කර අදාළ කාල සීමාව තුළ සභාවේ විෂය භාර නිලධාරී වෙත ලැබීමට සලස්වන මෙන් ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**(ඇ). <u>ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන ගරු සභාවට ඉදිරිපත් කිරීම</u> :-** කිසිවක් නැත.

**(ඈ). <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> :-** කිසිවක් නැත.

**(ඉ). <u>යථා පරිදි කල් දී ඇති යෝජනා</u> :-**

**(ඉ)(1). <u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යථා පරිදි කල් දී ඇති යෝජනා</u> :-**

(ඉ)(1)(අ). බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මාසික මහ සභා රැස්වීම සෑම මසකම තුන්වන අඟහරුවාදා දින පෙ.ව. 9.30 ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී පැවැත්වීම සුදුසු බවටත් එකී දිනය රජයේ නිවාඩු දිනයක් වන්නේ නම්, එම රැස්වීම ඉනික්බිතිව එළැඹෙන ප්‍රථම වැඩ කරන දිනයේ දී පැවැත්වීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වළල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව සභාපතිතුමා විසින් යෝජනාවට අදාළව ප්‍රශ්න සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(1)(ආ). බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් ව්‍යවස්ථාපිත කමිටු සඳහා සභාව තීරණය කරන පරිදි කමිටු සාමාජිකයින් පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

(අ) මුදල් හා ප්‍රතිපත්ති කමිටුව
(ආ) පරිසර හා පහසුකම් කමිටුව
(ඇ) නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව
(ඈ) කාර්මික සේවා කමිටුව

එක් කමිටුවක් සඳහා සභාවේ සභාපතිවරයා ද නිල බලයෙන් ඇතුළත් වන පරිදි සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විත වන පරිදි මෙම කමිටු පත් කිරීම සුදුසු බවට ද ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් ගරු සභාවට යෝජනා කරන ලදී.

i. ගරු මන්ත්‍රී මිගාර නේමින්ද වළල්ලාවිට මැතිතුමා
ii. ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා
iii. ගරු මන්ත්‍රී සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා
iv. ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා විසින් මුදල් කමිටුව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් ගරු සභාවට යෝජනා කරන ලදී.

i. ගරු මන්ත්‍රී රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා
ii. ගරු මන්ත්‍රී සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් පරිසර හා පහසුකම් කමිටුව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් ගරු සභාවට යෝජනා කරන ලදී.

i. ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා
ii. ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා
iii. ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා
iv. ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා විසින් පරිසර හා පහසුකම් කමිටුව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් ගරු සභාවට යෝජනා කරන ලදී.

i. ගරු මන්ත්‍රී ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා
ii. ගරු මන්ත්‍රී නිශාන්ත කුමාර මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් ගරු සභාවට යෝජනා කරන ලදී.

i. ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා
ii. ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා
iii. ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා විසින් නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් ගරු සභාවට යෝජනා කරන ලදී.

i. ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා
ii. ගරු මන්ත්‍රී නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා
iii. ගරු මන්ත්‍රී රුසිත නන්දන තුෂාර මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රී සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාර්මික හා සේවා කමිටුව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් ගරු සභාවට යෝජනා කරන ලදී.

i. ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා
ii. ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා
iii. ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා
iv. ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා විසින් කාර්මික හා සේවා කමිටුව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් ගරු සභාවට යෝජනා කරන ලදී.

i. ගරු මන්ත්‍රී ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා
ii. ගරු මන්ත්‍රී මර්වින් ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා ඇතුළුව ගරු මන්ත්‍රීවරුන් කමිටු සඳහා පත් කිරීමේ යෝජනාවට අදාළ ප්‍රශ්න සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් ඉහත නම් සඳහන් සභිකවරු පත් කිරීම විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

(ඉ)(1)(ඇ). බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සියලු ප්‍රසම්පාදන කාර්යයන් ඉටු කිරීම සඳහා සභාව තීරණය කරන සාමාජිකයන්ගෙන් යුත් ප්‍රසම්පාදන කමිටුවක් පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ප්‍රසම්පාදන කමිටුව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් ගරු සභාවට යෝජනා කරන ලදී.

i. ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය
ii. ගරු මන්ත්‍රී මිගාර නේමින්ද වළල්ලාවිට මැතිතුමා
iii. ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා
iv. ගරු මන්ත්‍රී සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා විසින් ප්‍රසම්පාදන කමිටුව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් ගරු සභාවට යෝජනා කරන ලදී.

i. ගරු මන්ත්‍රී උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා
ii. ගරු මන්ත්‍රී පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් ප්‍රසම්පාදන කමිටුව සඳහා ගරු සභාපතිතුමා ඇතුළුව ඉහත නම් සඳහන් සභිකවරු පත් කිරීම විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

(ඉ)(1)(ඇ). බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ නිල රාජකාරී කාර්යයන් සඳහා ප්‍රාදේශීය සභාව සතු අංක PF 7388 දරණ කැබ් රථය වෙන් කිරීම සුදුසු බවටත් ඒ සඳහා මාසිකව ලීටර් 450 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් ඉන්ධන සැපයීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

(ඉ)(1)(ඉ). සභාවේ ලේකම් පී. එච්. ටී. කේ. හේමචන්ද්‍ර මහත්මිය හදිසි අනතුරකට ලක් වීමෙන් අසනීප නිවාඩු ලබා ඇත. එතුමිය නැවත සේවයට වාර්තා කරන තුරු බෙන්තොට ප්‍රාදේශීය සභාව, බෙන්තොට ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන පහත ගිණුම්වලට අදාළ චෙක්පත් හා බැංකු අණකර අත්සන් තැබීමේ පළමු අත්සන්කරු ලෙස පී. එච්. ටී. කේ. හේමචන්ද්‍ර මහත්මියට පවරා තිබූ බලය අහෝසි කිරීමටත් එම බලය ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන නිලධාරිනිය වන ඩී. වාසනා තරංගි මහත්මියට පැවරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

2758780 - පොදු ගිණුම
81618288 - සේවක ණය ගිණුම
2759057 - කර්මාන්ත ගිණුම

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර ගරු සභාපතිතුමා ප්‍රශ්න විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(1)(ඊ). ප්‍රාදේශීය සභාවේ සාමාන්‍ය සභා රැස්වීම් පවත්වනුයේ මාසිකව වන බැවින් හදිසි අත්‍යවශ්‍ය වැය දැරීම් සිදු කිරීමට මාසයක පමණ කාල පමාවක් සිදු වේ. හදිසි හා අනපේක්ෂිත නඩත්තු වියදම් දැරීමට සිදු වීම, සැපයුම්කරුවන් සැපයීම් සිදු කිරීමේ දී එපමණ කාලයක් ණය පදනම මත ලබා නොදීම වැනි හේතූන් මත සභා අරමුදලින් ගෙවීම් කිරීමේ අවශ්‍යතාවයක් පැන නඟිනු ඇත. ඒ අනුව ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මඟින් සලකා බලා නිර්දේශ කරනු ලබන රුපියල් 500,000/- ක් දක්වා වූ කේවල ගෙවීම් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් කිරීමේ බලය, ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිවරයා වෙත පැවරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර ගරු සභාපතිතුමා ප්‍රශ්න විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(1)(උ). ප්‍රාදේශීය සභාවේ සභිකයින් සඳහා සභා බල ප්‍රදේශය තුළ නිල රාජකාරී ගමන්වල නිරත වීම වෙනුවෙන් මෝටර් රථයක්, ත්‍රී රෝද රථයක් හෝ යතුරු පැදියක් සඳහා රු. 3,000/- ක උපරිමයට යටත්ව සභාවේ අනුමැතිය මත මාසික ඉන්ධන දීමනාවක් ගෙවීම සඳහා 2013.04.22 දිනැතිව දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමා නිකුත් කළ අංක 1807/2 දරණ ගැසට් පත්‍රයේ අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත සභා අරමුදලින් රු. 3,000/-ක උපරිමයට යටත්ව මාසික ඉන්ධන දීමනාවක් ගෙවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ ප්‍රශ්න සභාපතිතුමා සභාවෙන් විමසන ලදුව, බෙදීමක් හෝ විරෝධතාවක් නොමැති වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(1)(ඌ). පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන්ගේ නිවාස හෝ ජංගම දුරකතන සඳහා සභාපතිවරයාට රු. 2,000/-ක උපරිම සීමාවක් ද උප සභාපතිවරයාට රු.1,500/-ක් සහ අනෙකුත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට රු. 1,000/- ක උපරිම සීමාවට යටත්ව දුරකතන දීමනා සභා අරමුදලින් ගෙවීම් කිරීම සඳහා දකුණු පළාත් සභාවේ අංක 472:3, 2008/08/05 හා අංක 508/8, 2009.08.11 දරණ අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව එකී අනුප්‍රමාණ මත සභා අරමුදලින් සභාපති උප සභාපති සහ සභිකයින්ට දුරකතන දීමනා ගෙවීම් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාවට අදාළ ප්‍රශ්න විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(1)(එ). සභාපතිවරයාගේ නිල රාජකාරී කාර්යයන් වෙනුවෙන් වෙන් කරනු ලබන නිල රථය බල ප්‍රදේශය තුළ හදිසි රාජකාරී සඳහා ධාවනය කිරීමේ දී නිත්‍ය රියදුරු නොමැති අවස්ථාවල දී, නිල වාහනය ධාවනය කිරීමට වලංගු රියදුරු බලපත්‍රයක් හිමි සභාපතිවරුන්ට ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ 2020.08.18 දාතමින් යුතුව අනුමැතිය ලබා දී ඒ බැව් දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් නිකුත් කරන ලද අංක 4/04/10 හා 2020.09.22 දිනැති ලිපියේ දැනුම් දී ඇත.

ඒ අනුව සභාපතිවරයා සඳහා වලංගු රියදුරු බලපත්‍රය හිමි බැවින් රියදුරු නොමැති අවස්ථාවල දී සභා බල ප්‍රදේශය තුළ නිල රථය සභාපතිවරයාට ධාවනය කිරීම සඳහා ද එම රථය රාජකාරී සඳහා යොදවා නොගන්නා අවස්ථාවල දී අවස්ථානුකූලව ප්‍රාදේශීය සභා කාර්යාල පරිශ්‍රයේ හෝ සභාපතිවරයාගේ නිත්‍ය පදිංචි නිවසේ ගාල්කර තැබීම සඳහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර සභාපතිතුමාගේ යෝජනාවට අදාළව ප්‍රශ්න විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(1)(ඒ). ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ රාජකාරී සම්බන්ධීකරණය සහ මහජන පැමිණිලි ආදිය සම්බන්ධ රාජකාරී කටයුතු වෙනුවෙන් සුදුසු මහජන සම්බන්ධතා නිලධාරියකු බඳවා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපස/ආ/01/02/15 හා 2021.04.18 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව සුදුසුකම් සහිත මහජන සම්බන්ධතා නිලධාරියකු සභා අරමුදලින් දීමනා ගෙවීමට යටත්ව සභාපතිවරයාගේ නිල කාලයට සීමා වන පරිදි බඳවා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර ප්‍රශ්න විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>රීති 11(8) යටතේ ඉදිරිපත් කරනු ලබන යෝජනා</u> :-**

**(ඉ)(2). <u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යථා පරිදි කල් දී නොමැති යෝජනා</u> :-**

(ඉ)(2)(අ). හුදෙක් වාණිජමය අරමුණකින් හෝ වෙනත් ආදායම් ඉපැයීමේ අරමුණකින් හෝ දේශපාලන අරමුණකින් තොරව පවත්වන පුණ්‍ය හා ප්‍රජා සත්කාරක කාර්යයන් සඳහා ප්‍රාදේශීය සභාවේ ක්‍රීඩා පිටි, භූමි ගාස්තු අය කිරීමකින් තොරව වෙන් කර දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩාංගණ හා විවිධ දේපළ විවිධ කාර්යයන් සඳහා බදු පදනමින් වෙන් කිරීම සිදු කරනවා. විවිධ පුණ්‍ය කටයුතු, දන්සැල් පැවැත්වීම් ආදී වූ ප්‍රජා සත්කාරක වැඩ සටහන් ආදිය සඳහා ද එම භූමි වෙන් කිරීම් සිදු කරන අවස්ථා පවතිනවා. එවැනි කටයුතු හුදෙක් ප්‍රජාවගේ මූල්‍ය සහයෝගීතාවයෙන් යුතුව සිදු කරන, බල ප්‍රදේශයේ ජනතාවට ප්‍රතිලාභ ලැබෙන පුණ්‍ය හෝ ප්‍රජා සත්කාරක වැඩසටහන්. එවැනි අවස්ථාවල සංවිධායකයින් ක්‍රීඩා පිටි හා ප්‍රාදේශීය සභා භූමීන් ගාස්තු අය කිරීමකින් තොරව වෙන් කර ගැනීමට ඉල්ලුම් කරනවා.

<u>ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>

අවුරුදු උත්සව ආදිය පැවැත්වීමට ක්‍රීඩා පිටි වෙන්කර ගැනීමේදී ද නොමිලේ ඒවා ලබා දීම සුදුසුයි.

<u>ගරු මන්ත්‍රී නිශාන්ත කුමාර මැතිතුමා</u>

එම භූමි ලබා දීමට අදාළව අනුමැතිය ලබා දෙන්නේ පිහිටුවා ගත් කමිටු හරහා ද නැතිනම් සභාපතිතුමාගේ තනි කැමැත්ත මත ද, එම ඉල්ලීම් අනුමත කරන බලධාරියා කවුද, කමිටුවක දී එවැනි ඉල්ලීමක් සඳහා බෙදීමක් ඇතිවුවහොත් සිදුවන්නේ කුමක් ද කියන කාරණා දැනගන්න අවශ්‍යයි.

<u>ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>
ආගමික, සංස්කෘතික ආදී මෙම කටයුතු මොනවාදැයි නිශ්චිත තීරණයක් ගෙන ඒ අනුව කටයුතු සිදු කිරීම වඩාත් සුදුසුයි.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
එම කාරණාව මූල්‍යමය කරුණක් වන බැවින් ඉදිරිපත් වන සියලුම ඉල්ලීම් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත යොමු කරලා එම ඉල්ලීම්වල පරමාර්ථය වාණිජමය කටයුත්තක් ද නැතිනම් සුභසාධන අරමුණකින් සිදු කරනු ලබන්නක් ද යන්න සලකා බලා ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමු. මුදල් කමිටුවේ දී ඒ සඳහා බෙදීමක් ඇති වුණොත් මුදල් කමිටු සාමාජිකයින්ගේ බහුතරයකගේ කැමැත්ත අනුව තීරණයක් ගත යුතුයි. ඕනම කමිටුවකට ඒකමතිකව තීරණයක් ගන්න බැරි වෙන්න පුළුවන්. එවැනි අවස්ථාවක ඡන්ද විමසීමකින් බහුතරයේ එකඟතාවය මත ගන්න තීරණය තමයි ක්‍රියාත්මක කරන්න වෙන්නේ. එළඹෙන මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ දී ඒ පිළිබඳව නිශ්චිත තීරණයක් ගැනීමට කටයුතු කරමු.

ඒ අනුව ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩාංගන සහ භූමි වාණිජමය නොවන අරමුණකින් සිදු කරනු ලබන වැඩසටහන් සඳහා නොමිලේ ලබා දීම සඳහා ඉදිරිපත් වූ යෝජනාවට විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(ආ). 2025 වර්ෂයට අදාළ බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පුස්තකාල උපදේශන කමිටුව සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා නිලබලයෙන් ඇතුළත් වන පරිදි පහත සාමාජිකයින්ගෙන් යුත් පුස්තකාල උපදේශන කමිටුවක් පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

I. ශ්‍රී ධර්මාරාම විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය පරේගම චන්ද්‍රාලෝක නා හිමි
II. ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා
III. ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා
IV. ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය
V. ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය
VI. විශ්‍රාමලත් පාසල් ආචාර්ය වජිර වළල්ලාවිට මහතා
VII. විශ්‍රාමලත් ග්‍රාම නිලධාරී ආර්. කේ. ලැනරෝල් මහතා

මෙම කමිටුව සඳහා සුදුසු තවත් සාමාජිකයින් නම් කිරීමටද ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

- ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා විසින් පුස්තකාල උපදේශන කමිටුව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් ගරු සභාවට යෝජනා කරන ලදී.

i. ගරු මන්ත්‍රී මර්වින් ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා
ii. ගරු මන්ත්‍රී ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ඇම්. ඩී. මුනිදාස ගත්කතුවරයා ද මෙම කමිටුවට සුදුසු බව යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

- ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් විශ්‍රාමලත් පාඨශාලාචාරිනී ශ්‍රේටා කන්නන්ගර මහත්මිය ද මෙම කමිටුවට සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

වෙනත් යෝජනා ඉදිරිපත් නොවූ බැවින් ද, පුස්තකාල උපදේශන කමිටුව සඳහා බල ප්‍රදේශයේ ජනතාවගෙන් ඉහත නම් කරන ලද සාමාජිකයින් 05 දෙනා සඳහා විරෝධතාවයක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් ද, එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(ඈ). මහ ඌරගහ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මඟින් පවත්වනු ලබන මාතෘ හා ළමා සායනයේ අත්‍යවශ්‍ය හදිසි නඩත්තු කටයුතු ප්‍රාදේශීය සභාවේ අරමුදලින් ඉටු කර දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ දී ඉදිරිපත් වූ මෙම යෝජනාව ඉතාමත් කඩිනම් අවශ්‍යතාවක් බැවින් ඊයේ දින, එම ප්‍රදේශයේ තාක්ෂණ සේවා නිලධාරී මහතා සමඟ එම ස්ථානය නැරඹීමට ගියා. එහි ත්‍රිපෝෂ ගබඩා කරන කාමරයේ දොරේ කොටසක් මේ වන විට වේයන් කා දැමීම හේතුවෙන් දිරාපත් වී බිමට වැටී තියෙනවා. සිවිලිම වේයන් කා දැමීම හේතුවෙන් කැඩී තියෙනවා. ගැබිණි මව්වරුන් හා කුඩා දරුවන් ද මෙම ස්ථානයට පැමිණෙන බැවින් ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් මෙම ස්ථානයේ අලුත්වැඩියා කටයුතු මේ මොහොතේ සිටම ආරම්භ කළ යුතු අත්‍යවශ්‍ය කටයුත්තක් බව දන්වන්න කැමතියි.
යෝජනාව සභාවට ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඊට අදාළ ඇස්තමේන්තුව ද ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුණත් ඇස්තමේන්තු සකස් කිරීමට තරම් කාලයක් තිබුණේ නැහැ. නැවත මහ සභාවක් පැවැත්වෙන්නේ තවත් මාසයකින්. ඒ නිසා එළඹෙන මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට එම ඇස්තමේන්තුව ඉදිරිපත් කර එම නිර්දේශය මත අලුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමේත්, ඊළඟ මහ සභාවට එම ඇස්තමේන්තුව ඉදිරිපත් කර අනුමත කරවා ගැනීමේත්, එකඟතාවය මත මෙම අලුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමේ යෝජනාව සම්මත කිරීම සුදුසුයි."

<u>ගරු මන්ත්‍රී විජිත් සම්පත් මැතිතුමා</u>
එම ව්‍යාපෘතිය ඉටු කිරීමට බලාපොරොත්තුවන ක්‍රමවේදය පිළිබඳ දැන ගැනීමට අවශ්‍යයි සහ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම පමණක් නොව, එහි නඩත්තු කටයුතු පිළිබඳව ද මැදිහත් වීමක් සිදු කිරීම සුදුසුයි.

<u>ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා</u>
මින් පෙරත් එහි අලුත්වැඩියා කටයුතු සිදු කළත් නඩත්තු කටයුතු නිසියාකාරව සිදු නොවූ නිසා පරණ තත්ත්වයටම නැවත පත් වුණා. ඒ නිසා නඩත්තු කටයුතු සිදු කිරීම අවශ්‍යයි.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගෙන එහි කටයුතු සිදු කිරීමට යම් කාලයක් ගත වන බැවින් එම ව්‍යාපෘතිය කොන්ත්‍රාත් පදනමින්, ගිවිසුම් අත්සන් කර එම ප්‍රදේශයේ ක්‍රියාකාරී සමිතියක් හරහා එම අලුත්වැඩියාව සිදු කිරීමට අදහස් කරනවා. ඒ වගේම ඉදිරි මුදල් කමිටුවට එම සමිතිය යෝජනා කර ලබා දීමට එම ප්‍රදේශයේ මන්ත්‍රීතුමන්ලා තිදෙනා වෙත ලබා දෙනවා.

ඒ අනුව මහ ඌරගහ මාතෘ හා ළමා සායනයේ අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු කඩිනමින් සහා අරමුදලින් සිදු කිරීමට ඉදිරිපත් වූ යෝජනාව සඳහා විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(ඈ). දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ ප්‍රතිපාදන වෙන් වී ඇති පහත සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

<u>ව්‍යාපෘති</u>

I. කොබෙයිදූව පෙර පාසලේ රැඳවුම් බිත්තිය සමඟ ආරක්ෂිත වැට ඉදි කිරීම.
II. කොම්පෝස්ට් අංගනයේ ආරක්ෂිත වැට ගේබියන් බැම්ම හා කසල තෝරන ගොඩනැගිල්ල ඉදි කිරීම.
III. කොම්පෝස්ට් අංගනය සඳහා උපකරණ මිල දී ගැනීම.

ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මිලියන 700 ක කසල ව්‍යාපෘතියක් පිළිබඳ වැඩසටහනක් පසුගිය දිනක ගාල්ලේ දී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිශාන්ත පෙරේරා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණා. අතිශයින්ම ප්‍රයෝජනවත් වූ එම වැඩ සටහනේ දී කොම්පෝස්ට් සාදන සරලම හා පහසුම ක්‍රමවේදයක් පිළිබඳ දැනුවත් කිරීමක් සිදු කරා. ඒ සඳහා වෙන් කරන ලද කසල අවශ්‍ය වන බවත්, අක්කර 3 ක පමණ භූමි කොටසක සකස් කරන ලද හරිතාගාරයක් තුළ දළඹු වර්ගයක් මඟින් මෙම ක්‍රියාවලිය සිදු වන බව එහිදී දැනුවත් කළා. මේ කටයුත්ත ආරම්භ කිරීමට යම් කාලයක් ගත වන බැවින් එතෙක් අප සභාවේ කොම්පෝස්ට් අංගනයේ ඉතිරි ඉදි කිරීම් සිදු කර කසල වර්ගීකරණ කටයුතු සිදු කිරීම සුදුසුයි.
ඒ වගේම කොම්පෝස්ට් අංගන භූමියේ ගොඩ ගැසී ඇති කසල දිරාපත් වීමේ දී එයින් ගලා යන ඕජස් බලි ඇළට එක් වී පරිසර දූෂණයක් සිදු වෙනවා. ඒ හේතුවෙන් බලි ඇළ හා කොම්පෝස්ට් අංගනය අතර බැම්මක් ඉදි කිරීමටත්, කොම්පෝස්ට් අංගනයේ කසල වෙන්කිරීමේ කටයුතුවල නිරත කම්කරුවන්ට අත් පා සේදීමට ජල පහසුකම්, වැසිකිළි පහසුකම් නොමැති නිසා සනීපාරක්ෂක පහසුකම් සලසා දීමටත් අවශ්‍යයි.

<u>ගරු මන්ත්‍රී දිනේෂ් සේරසිංහ මැතිතුමා</u>
යාත්‍රාමුල්ල කොට්ඨාශයේ ජනතාවගෙන් සමහරෙක් පාරේ කුණු එකතු කර තැබීම නිසා පසුගිය දිනවල පොලිසියෙන් අත්අඩංගුවට ගෙන තිබුණා. හේතුව පාරේ කුණු එකතු කර තැබීම තහනම් බව ප්‍රදේශයේ ජනතාව දැනුවත් නොවී තිබීම. කසල ට්‍රැක්ටරයට නළාවක් තිබුණත් ඒකේ හඬ ඉතා අඩු නිසා රථය මඟ හැරී යාමෙන් කසල ලබා දීමට නොහැකි වන අවස්ථාත් තිබෙනවා. ඒ වගේම කසල ට්‍රැක්ටර්වල ගමන් කරන කම්කරුවන් මුඛ ආවරණ, අත්වැසුම්, හිස් ආවරණ ආදිය පැළඳ ගමන් කිරීමට යෙදවීම සුදුසුයි.

<u>ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය</u>
කසල ගැටලුව හේතුවෙන් යාත්‍රාමුල්ල කොට්ඨාශයේ ජනතාව දැඩි අපහසුතාවයකට පත්වෙලා ඉන්නේ. කසල එකතු කිරීමට පැමිණෙන දින නිවැසියන් නොමැති වීම නිසා කසල ලබා දීමට නොහැකි වීමත් ගැටලුවක්. ඒ වගේම කසල එකතු කිරීමට පැමිණීමට නියමිත දිනයට රථය නොපැමිණීම හේතුවෙන් කසල ගොඩ ගැසී බල්ලන් විසින් ඒවා ඇද දමා පාර පුරා විසුරුවා දැමීමත් ගැටලුවක්. ඒ නිසා මේ සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීම සුදුසුයි.

<u>ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>
ජල හා කසල ප්‍රශ්න සඳහා කඩිනම් වැඩපිළිවෙළක් යෙදීම අවශ්‍යයි. බෙන්තොට ප්‍රදේශය සංචාරකයන් බහුලව ගැවසෙන මර්මස්ථානයක්. කසල එකතු කරගෙන යනකොට කසල ට්‍රැක්ටර්වලින් ගලන ඕජස් පාරේ වැටී ඇතිවන දුර්ගන්ධය දිගටම පවතිනවා. සංචාරකයන් එම ඕජස්

හරහා පැන පැන ගමන් කරනවා. මෙම තත්ත්වය මග හරවා ගන්න ඉක්මන් වැඩ පිළිවෙළක් යෙදීම සුදුසුයි. කසල එකතු කිරීමේ කටයුතු සඳහා අති නවීන කුණු එකතු කරන යන්ත්‍රයක් ලබා ගැනීමත් සුදුසුයි.

<u>**ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා**</u>
ඉඳුරුව, ගෝනගල ප්‍රදේශවල කසල බෙන්තරට නොදා ඒ ප්‍රදේශයේම ඉඩමක් වෙන් කරගෙන එම කසල බැහැර කිරීම සුදුසුයි. දිරන කසල වෙන්කොට මසකට වතාවක් පස් දමා තුනී කිරීමත් සුදුසුයි.

<u>**ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>
මෙම කසල ගැටලුව පිළිබඳ සාකච්ඡා කිරීමට විශේෂ සභාවක් කැඳවීම සුදුසුයි. අප සතුව කසල ට්‍රැක්ටර් 02 ක් පමණක් තිබෙන නිසාත්, රියදුරන් නිවාඩු දිනවල දී ධාවනය කිරීමට කෙනෙකු නොමැති වන අවස්ථාවල දීත්, නියමිත කාල සටහනට අනුව එම ප්‍රදේශවලට යාමේ අපහසුවක් පවතිනවා. තවත් කසල ටේලරයක් සකස් කිරීමට අවශ්‍ය ටේලර් මැෂිනයක් සහ අමුද්‍රව්‍ය ගබඩාවේ පවතිනවා. ඉක්මනින් එය සකස් කර භාවිතයට ගැනීමට බලාපොරොත්තු වෙනවා. ඒ වගේම මින් ඉදිරියට කසල එකතු කර ගැනීමේ දී වෙන් කරන ලද කසල පමණක් ලබා ගන්නවා. අත් පත්‍රිකා මුද්‍රණය කර සති දෙකක පමණ කාලයක් ඇතුළත එම අත් පත්‍රිකා ලිඛිතව ජනතාව වෙත භාර දී දැනුවත් කිරීමේ කටයුතු සිදු කර එම කටයුත්ත ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. කසල රථයේ ගමන් කිරීම සඳහා දෛනික පදනම මත අලුතින් සේවකයන් දෙදෙනෙකු බඳවා ගැනීමටත් අදහස් කරනවා. ඒ වගේම කම්කරු මහතුන් සඳහා නිල ඇඳුම් කට්ටල 03 බැගින් ලබා දීලයි තියෙන්නේ.
ඒ වගේම කසල අංගනය සඳහා අවශ්‍ය උපකරණ මිල දී ගැනීමට මිල ප්‍රතිපාදන වෙන් කරලා තියෙන බව දැනුවත් කරලා තියෙනවා. ඒ නිසා සභා අරමුදලින් වැය දැරීමේ අවශ්‍යතාවක් නැති නිසා එමඟින් ට්‍රැක් ලෝඩරයක් ලබා ගැනීම සුදුසුයි.

ඒ අනුව දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ ප්‍රතිපාදන වෙන් වී ඇති සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීම සුදුසු බවට ඉදිරිපත් වූ යෝජනාවට ගරු සභාපතිතුමා විසින් ප්‍රශ්න විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(ඉ). සභාවේ කසල අංගනයේ කසල ගොඩ ගැසී ඇති බැවින් කඩිනමින් කසල තල්ලු කිරීම සිදු කළ යුතුව ඇත. සභාවේ බැකෝ රථය ද අබලන් බැවින් ඒ සඳහා යෙදවීමට සුදුසු යන්ත්‍රයක් සභාවේ නොමැති බැවින් සුදුසු යන්ත්‍රයක් මිල කැඳවීම් කර කුලී පදනමින් ලබාගෙන කසල තල්ලු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

ගරු මන්ත්‍රී තිලක් උපුල් වමින්ද මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>**ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>
සභාවේ බැකෝ යන්ත්‍රය කඩිනමින් සාදා නිමකරන තෙක් කසල තල්ලු කිරීමේ කටයුතු සඳහා වෙනත් බැකෝ යන්ත්‍ර, එක්ස්කැවේටර් යන්ත්‍ර හා වෙනත් හදිසි අවශ්‍යතා සඳහා අවශ්‍ය වන උපකරණ එම අවශ්‍යතාවය මත මිල ගණන් කැඳවා අනුමත දිස්ත්‍රික් මිල කමිටු රේටයන් යටතේ ලබා ගැනීම සුදුසුයි.”

<u>**ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා**</u>
සභාපතිතුමනි, සභාවේ බැකෝ යන්ත්‍රයේ වර්තමාන තත්ත්වය කොහොම ද?

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් බවට සභාව පත් කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පෙ.ව. 11.05 ට කාරක සභා අවස්ථාව ආරම්භ විය.

වාහන විෂය නිලධාරී කැඳවා බැකෝ යන්ත්‍රයේ වර්තමාන තත්ත්වය පිළිබඳ ව එහි දී සාකච්ඡා කරන ලදී.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභා අවස්ථාව අහෝසි කිරීමට කළ යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පෙ.ව. 11.15 ට කාරක සභාවේ කටයුතු අවසන් වී මහ සභාවේ කටයුතු ආරම්භ විය.

**(ඊ).** **කාරක සභාවල වාර්තා සලකා බැලීම :-** කිසිවක් නොමැත.

**(උ).** **ලැබීම් හා ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශය එකතු කල ආදායම් පිළිබඳ ප්‍රකාශ වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම සලකා බැලීම.**

**(උ)(1). 2025 ජුනි මස ලැබීම් වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.**

2025 ජුනි මස ලැබීම් හා වියදම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

| 2025 ජුනි මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය | |
|---|---|
| පුනරාවර්තන ආදායම් එකතුව | 6,701,545.12 |
| එකතු කලා මූලධන ලැබීම් :- | 550.00 |
| පුනරාවර්තන හා මූලධන ලැබීම්වල එකතුව | 6,702,095.12 |
| තැන්පත් | 485,382.87 |
| සේවක ණය | 412,459.91 |
| දේපළ ණය පොළී | 9,560.68 |
| සාමාන්‍ය අත්තිකාරම් | 233,683.24 |
| බලපත්‍ර බදු | 7,725.00 |
| වැටුප් හා වවුචර් මුද්දර බදු | 3,225.00 |
| 101 ට බැර | 33,083.00 |
| 201 ට බැර | 40,000.00 |
| එකතුව | **7,927,214.82** |
| 2025 ජුනි මස ඒකාබද්ධ වැය සාරාංශය | |
| පුනරාවර්තන වියදම් එකතුව | 9,761,119.70 |
| එකතු කලා -ප්‍රාග්ධන වියදම් | - |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වැයවල එකතුව | 10,203,422.40 |
| දේපළ ණය පොළී | 14,938.83 |
| තැන්පත් | 517,028.54 |
| සාමාන්‍ය අත්තිකාරම් | 178,445.00 |
| ගබඩා අත්තිකාරම් | 251,849.50 |
| සේවක ණය | 769,600.00 |
| ණය හිමියෝ | 2,804,460.00 |
| එකතුව | **14,739,744.27** |

2025 ජුනි මස ලැබීම් හා වියදම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වළල්ලාවිට මැතිතුමා විසින් කරන ලද යෝජනාව, ගරු මන්ත්‍රී තාරක විජේකොන් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**(උ)(2). <u>2025.06.30 දිනට බැංකු සැසඳුම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2025.06.30 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගිණුම් අංක 2758780 දරණ පොදු ජංගම ගිණුම, අංක 2759057 දරණ කර්මාන්ත ගිණුම, අංක 81618288 දරණ සේවක ණය ගිණුම යන බැංකු ගිණුම්වලට අදාළ බැංකු සැසඳුම් වාර්තා ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම බැංකු සැසඳුම් වාර්තා පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂාන්ති මැතිතුමිය විසින් කරන ලද යෝජනාව, ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**(උ)(3). <u>2025.06.30 දිනට හිඟ ආදායම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2025.06.30 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී

2025 ජුනි මස බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වළල්ලාවිට මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**(උ)(4). <u>ගෙවීම් වවුචර් සභාවට ඉදිරිපත් කිරීම.</u>**

| අනු අංකය | වවුචර් අංකය | ආදායකයාගේ නම | විස්තරය | මුදල (රු.) |
|---|---|---|---|---|
| 01 | 01 | ඕ.වී. කසුනි ගයාත්‍රි විතානගේ | පෙර පාසල් ගුරු තනතුරේ සේවය කිරීම වෙනුවෙන් 2025 ජුනි මස වැටුප් දීමනා ගෙවීම. | 22,045.00 |
| 02 | 02 | එම්.ඩී. පැතුම් තරංග අබේරත්න | සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවය කිරීම වෙනුවෙන් 2025 ජුනි මස වැටුප් දීමනා ගෙවීම. | 22,763.81 |
| 03 | 03 | ඩබ්. කේ. අචිනි තරුෂිකා | පෙර පාසල් ගුරු තනතුරේ සේවය කිරීම වෙනුවෙන් 2025 ජුනි මස වැටුප් දීමනා ගෙවීම. | 25,975.00 |
| 04 | 04 | මු/හා - ලේකම්, බෙන්තොට ප්‍රාදේශීය සභාව | 2025.04.01 සිට 2025.06.30 දින දක්වා II වන කාර්තුවට අදාළ මුද්දර බදු හා බලපත්‍ර බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම. | 30,965.00 |
| 05 | 05 | මු/හා - මෙනුරි යශෝධා වික්‍රමරත්න | 2025 ජුනි මස පරිගණක පුහුණු දීමනාව ගෙවීම. | 20,000.00 |

ගරු මන්ත්‍රී මිගාර වළල්ලාවිට මැතිතුමා විසින් ඉහත ගෙවීම් වවුචර් ගෙවීම සුදුසු බවට ඉදිරිපත් කළ යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(උ)(5). <u>ලිපි අංක 01</u>**

මගේ අංක GS/SP/ADM/03/09/2(II) හා 2025.06.18 දිනැතිව "පළාත් පාලන ආයතනවල PL තනතුරු දරණ සේවකයන් සඳහා රාජකාරී පැවරීම" මැයෙන් දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් විසින් පළාත් පාලන ආයතනවල PL තනතුරු දරණ සේවකයන් සඳහා රාජකාරී පැවරීම සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර ඇති ලිපිය මහජන නියෝජිතයන්ගෙන් යුත් සභාව වෙත ඉදිරිපත් කර, ඒ සම්බන්ධව තීරණයක් ගන්නා ලෙස එවා ඇති ලිපිය ගරු සභාවට ඉදිරිපත් කිරීම.

<u>ගරු මන්ත්‍රී සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා</u>

මින් ඉදිරියට නිසි කාර්ය පටිපාටියට අදාළව තනතුරුවලට පමණක් බඳවා ගැනීම් සිදු කිරීම සුදුසුයි.

<u>ගරු මන්ත්‍රී නිශාන්ත කුමාර මැතිතුමා</u>

අභ්‍යන්තර බඳවා ගැනීම් සිදු කරන්න බැරි ද?

<u>ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>

මින් ඉදිරියට මෙවැනි දේ සිදු නොවෙන්න වගබලා ගැනීම මෙන්ම මේ සම්බන්ධව මානුෂීය පියවරක් ගැනීම සුදුසුයි.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

අදාළ තනතුරේ පිහිටුවනවා නම් ඒ පුරප්පාඩු පුරවලා ඉන්න ඕන. දැනට ඉන්න කම්කරුවෝ මදි. ඒ නිසා මේ අඩුපාඩු හදාගන්නකම් දැනට ආයතනයේ කටයුතු පවත්වා ගෙන යාමට දැනට ඉන්න තනතුරු වලම තබා ගැනීම සුදුසුයි.

ඒ අනුව පුරප්පාඩු සපුරන තෙක් දැනට නියැලෙන තනතුරුවලම PL තනතුරේ සේවකයන් තබා ගැනීම ඒකමතිකව සභා සම්මත විය.

**(උ)(6). <u>ලිපි අංක 02</u>**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය-ඇල්පිටිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී පාඨමාලාව නිමකළ ඩබ්ලිව්. සෙනාලි තිසරණී යන සිසුවියට අදාළව ප්‍රාදේශීය සභාවේ මාස 06 ක ප්‍රායෝගික පුහුණු අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලා එම පුහුණු මධ්‍යස්ථානයේ ස්ථාන භාර නිලධාරී විසින් එවන ලද මගේ අංක HR/OJT/IT/2025/01/09 හා 2025/06/09 දිනැති ලිපිය සභාවේ අවධානයට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව ඩබ්ලිව්. සෙනාලි තිසරණී ශිෂ්‍යාව සඳහා මාස 06 ක පුහුණු කාලයක් සභාවේ අරමුදලින් දෛනික පුහුණු දීමනා ලෙස රු. 1,000/- ක් ලෙස ගෙවීමට යටත්ව ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඌ). <u>වෙනත් කරුණු</u>**

**<u>ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් ඉදිරිපත් කිරීම.</u>**

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

සභාපතිවරයා හැටියට මම මුලින්ම මාව බෙන්තර ප්‍රාදේශීය සභාවට 4 වෙනි වතාවටත් මන්ත්‍රීවරයෙක් විදියට තෝරා පත් කිරීම වෙනුවෙන් මගේ කොට්ඨාශයේ ආදරණීය ජනතාවට ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම මාව සභාපතිවරයෙක් විදියට තෝරා පත්කර ගැනීමට ඡන්දය ලබා දුන් උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් ස්තූතිවන්ත වෙනවා. කුමන දේශපාලන පක්ෂ මතවාද දැරුවත් මේ සභාව තුළ මා ඔබේ සභාපතිවරයා. ඔබ මගේ මන්ත්‍රී මණ්ඩලය. ඔබ සියලු දෙනාගාව මේ සභාව දියුණු කිරීමට විවිධ සාධනීය අදහස් තියෙන්න පුළුවන්. එම යෝජනා ඉදිරිපත් කරන්න. මම පක්ෂ පාට භේදයකින් තොරව ඒ සඳහා දෙන්න පුළුවන් උපරිම සහයෝගය ලබා දෙනවා. මේ සභාව ගොඩනගන්න එකතු වෙලා වැඩ කරමු.

<u>ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>

බෙන්තර ප්‍රාදේශීය සභාවට නවක මන්ත්‍රීවරයෙක් ලෙස තේරී පත් වූ මා නිතරඟයෙන්ම උප සභාපති ලෙස පත් කරාට හැමදෙනාටම ස්තූතියි ඒ වගේම මට ඡන්දය ලබා දීපු මගේ කොට්ඨාශයේ ජනතාවටත් ස්තූතියි.

<u>ගරු මන්ත්‍රී මීගාර වළල්ලාවිට මැතිතුමා</u>

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් අතුරුවැල්ල කොට්ඨාශය නියෝජනය කළ මා තෝරා පත්කරගත් සියලුම දෙනාට මගේ ආදර ස්තූතිය පුද කර සිටිනවා. ඒ වගේම තමයි මගේ පූර්ණ සහයෝගය සභාපතිතුමාට ලබා දෙනවා. මම අනික් මන්ත්‍රීවරුන්ටත් ආරාධනා කරනවා සභාපතිතුමාට සහයෝගය දක්වන්න කියලා. හැමදෙනාටම මම සුභ පතනවා. ස්තූතියි.

<u>ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය</u>

යාත්‍රාමුල්ල කොට්ඨාශය නියෝජනය කරන මම 2නි වතාවට තමයි ප්‍රාදේශීය සභාවට තේරී පත් වෙන්නේ. සමගි ජන බලවේගය නියෝජනය කරපු මන්ත්‍රී ධූර දෙකෙන් ලැයිස්තුවෙන් වැඩිම මනාප හිමිකරගත් කාන්තා මන්ත්‍රීවරිය විදියට සභාව නියෝජනය කරන්න මට අවස්ථාව ලබා දුන්නට සමගි ජන බලවේගයේ ගාලු දිස්ත්‍රික් නායක, ප්‍රධාන සංවිධායක බෙන්තර ඇල්පිටිය පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමාටත්, පක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාටත් මගේ ස්තූතිය පුද කර සිටිනවා. බෙන්තර ඉඳුරුව පහළගම්භය නියෝජනය කරමින් කොට්ඨාශ වශයෙන් හා ලැයිස්තුවෙන් තරඟ වැදුණු සියලුම අපේක්ෂකයන්ටත් මගේ ස්තූතිය පුද කර සිටිනවා. ඒ හැම දෙනාගෙම කැපවීම, ශක්තිය මත තමයි මේ ජයග්‍රහණය ලැබුවේ. බෙන්තර ප්‍රාදේශීය සභාවේ තේමා පාඨය තමයි "කාර්යක්ෂම හා ඵලදායී සේවයක් සැපයීම තුළින් ජනතා අපේක්ෂා සපුරාලීම". මන්ත්‍රීවරියක් විදියට දිවුරුම් දීපු මොහොතේ ඉඳන්ම මේ අරමුණින් ක්‍රියා කරනවා. ජාතික ජන බලවේගය නියෝජනය කරන සියලු මන්ත්‍රීවරුන්ට හා සමස්ථ කාර්ය මණ්ඩලයටත් මා ආරාධනා කරනවා එක්වෙලා සහයෝගයෙන් කටයුතු කරමු කියලා.

<u>ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා</u>

මා නියෝජනය කළ මහගොඩ කොට්ඨාශයෙන් මා ජයග්‍රහණය කරවීම වෙනුවෙන් සියලුම ජනතාවට මම ස්තූතිය පුද කර සිටිනවා. "වංචාව දූෂණයෙන් තොර රටක්" කියන තේමාව යටතේ බෙන්තර ප්‍රාදේශීය සභාව ලංකාවේ හොඳම ප්‍රාදේශීය සභාවක් කරන්න කැපවෙමු. ඔබ සියලු දෙනාට ස්තූතියි.

<u>ගරු මන්ත්‍රී දිනේෂ් සේරසිංහ මැතිතුමා</u>

ප්‍රථමයෙන් මම සුභ පතනවා ගරු සභාපති ප්‍රේමකුමාර මැතිතුමාට. ඒ වගේම සිහිපත් කරන්න කැමතියි රෝහණ විජේවීර ඇතුළු අනෙකුත් සහෝදරවරුන්ව. කොට්ඨාශ 10 කින් අපිව ජයග්‍රහණය කරවන්න ඡන්දය ලබා දුන් ප්‍රදේශවාසීන් මෙන්ම මගේ ප්‍රදේශයේ විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලා ඇතුළු

හැම දෙනාටමත් ස්තූතියි. අපිට නායකත්වය දුන් කොඩිතුවක්කු සහෝදරයාටත් ස්තූතිවන්ත වෙනවා අපිව මේ වගේ තැනකට ගෙන ආවට. බෙන්තර ප්‍රදේශයේ පාසල් හා සංචාරක කර්මාන්තය මේ වන විට අඩියටම වැටිලා තියෙන්නේ. ජනතාව බලාපොරොත්තු වන දූෂණ වංචාවෙන් තොරව වැඩ කටයුතු ටික සිදු කර ඒවා නගා සිටුවීමට කටයුතු කරමු. පක්ෂ භේදයකින් තොරව ඒ සඳහා අපිට සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලනවා.

<u>ගරු මන්ත්‍රී රංජිත් අමරසිරි මැතිතුමා</u>

ජාතික ජන බලවේගය නියෝජනය කරමින් බෝධිමළුව කොට්ඨාශයෙන් මා ජයග්‍රහණය කළා. පක්ෂග්‍රාහීකම්, කෙනෙහෙලිකම් වලින් තොරව විනිවිදභාවය තුළ වැඩ කරනවා නම් අපේ සහයෝගය ලබා දෙනවා. සියලු දෙනාට ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු මන්ත්‍රී උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා</u>

මම නියෝජනය කරන්නේ වැඩිම ජනතාවක් ජීවත් වෙන ග්‍රාම සේවා වසම් 03 කින් සමන්විත දෝපේ කොට්ඨාශය. මේ මැතිවරණ ව්‍යාපාරයේ කොටස්කරුවකු වශයෙන් සිටිමින් විවිධ වූ දේශපාලන පක්ෂවල මන්ත්‍රීවරුන් සමඟ කටයුතු කිරීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. පක්ෂ පාට භේදයකින් තොරව හොඳ වැදගත් කටයුතු සඳහා මගේ පූර්ණ සහයෝගය ලබා දෙනවා. බොහොමත්ම ස්තූතියි මේ අවස්ථාව මට ලබා දුන්නාට.

<u>ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>

මා නියෝජනය කරන හබුරුගල කොට්ඨාශයේ ජනතාවට මම මුලින්ම ස්තූතිවන්ත වෙනවා ඡන්ද 881 ක් ලබා දීලා මාව ජයග්‍රහණය කරවීම පිළිබඳව. යෞවන සමාජ ව්‍යාපාරය තමයි මගේ ගමන් මගේ සුවිශේෂ සංධිස්ථානය. ස්වේච්ඡා සේවකයෙක් විදියට ස්වේච්ඡා සංවිධාන එක්ක ඉතාම ක්‍රියාකාරීව වැඩ කරලා බෙන්තරම ආවරණය වන පරිදි තරුණයන් එක්ක අදටත් තරුණයෙක් විදියට මේ සභාව නියෝජනය කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. ඒ වගේම විවිධ දේශපාලන පක්ෂ සමඟ මම විවිධ අවස්ථාවලදී කටයුතු කරලා තියෙනවා. මම දේශපාලනයට එන්නේ 2018 ප්‍රාදේශීය සභා මැතිවරණයේ දී. මේ රටේ සමස්ථ තාරුණ්‍ය බලාපොරොත්තු වෙන වෙනසක් සිදු වෙමින් පවතිනවා. මේ වෙනසෙ දී හැමෝම කතා කළා වගේ විනිවිදව විවෘතව වැඩ කරන්න ඕන. 65,000 ක් වූ බෙන්තර ජනතාව වෙනුවෙන් බෙන්තරට උපරිම සේවයක් කරන්න අපි 23 දෙනාම කැපවෙමු. ඉතාමත්ම හොඳ සභාවක් ඇති කරන්න පුළුවන් උපරිම හයිය ලබා දෙමුයි කියමින් මම නිහඬ වෙනවා.

<u>ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා</u>

වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබා දෙමින් ඇලකාක කොට්ඨාශයෙන් මාව ජයග්‍රහණය කරාට මගේ ප්‍රදේශයේ ජනතාවට මම ස්තූතිවන්ත වෙනවා. සභාව තුළ හරි විදියෙදි අපි සභාව පැත්තේ හිට ගන්නවා. වැරදි දේට අපි විරුද්ධ වෙනවා කියලා ප්‍රකාශයක් සිද්ධ කරමින් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ට සුභාශිංසන එකතු කරමින් මම නිහඬ වෙනවා.

<u>ගරු මන්ත්‍රී නිශාන්ත කුමාර මැතිතුමා</u>

කොඩිතුවක්කු සහෝදරයාගේ ඉල්ලීම මත ප්‍රාදේශීය සභාවට තරඟ කරපු මට ඡන්ද 980 ක් අරගෙන මන්ත්‍රීවරයෙක් වෙන්න සහයෝගය ලබා දුන් ජාතික ජන බලවේගයේ ක්‍රියාකාරීන් මම මේ වෙලාවේ ඉතා භක්තියෙන් යුතුව සිහිපත් කරනවා. පොහොසත් රටක් ලස්සන ජීවිතයක් කියන තේමාව යටතේ අපට අවශ්‍ය වන්නේ හැකියාවන් තියෙන රටක් බිහි කරන්න. අපේ නොහැකියාවන් දූර්වලකම් තියෙනවා නම් ඒවා වහගෙන හැකියාවන් ඉස්මතු කරගෙන සැවොම එකතු වෙලා මේ ප්‍රාදේශීය සභාව ගොඩගන්න තීරණ ගමු කියන කාරණාව කියමින් මම ස්තූතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දුන්නට.

**<u>ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>**

මම මුලින්ම සුභ පතනවා ගරු සභාපතිතුමාට. ඒ වගේම අපිට කොට්ඨාශ 10 ක් ජයග්‍රහණය කරන්න කරන්න උරදුන් සියලුම අපේ ජනතාවටත්, ඡන්දය දුන් නුදුන් සියලු දෙනාටත් ස්තූතිවන්ත වෙනවා. දේශපාලන වේදිකාවේ විවිධ මත අනුව වෙන් වෙන්ව තරඟ කරපු අපි දැක් එක්ව මේ බෙන්තර ගොඩනඟන වැඩපිළිවෙළට උර දීලා තියෙනවා. අපි 11 දෙනා සාමූහික දේවල් වල දී සභාවත් සමඟ හිට ගන්නවා. ඒ වගේම සමීපව හැම දෙයක් ගැනම නිරීක්ෂණය කරනවා. ඒක අපේ දේශපාලන ක්‍රමය. මා නියෝජනය කරන කයිකාවල ප්‍රදේශයේ ජනතාව වැඩි ඡන්දයෙන් මා ඉහළින්ම ඔසවා තැබීම පිළිබඳ ස්තූතිවන්ත වෙමින් මේ බෙන්තර රම්‍ය පුරවරයක් කරන වැඩේට අපි උපරිම ශක්තියෙන් කැප වෙනවා ඒ වෙනුවෙන් සහයෝගය දෙනවා කියන පණිවුඩය මතක් කරමින් මුළු රටටම ආදර්ශයක් වෙන්න පුළුවන් සභාවක් වෙනුවෙන් කටයුතු කරමු කියලා නැවත මතක් කරමින් මේ අවස්ථාව ලබා දුන්නට සභාපතිතුමාට ස්තූතිවන්ත වෙමින් ජයවේවා කියලා පතනවා.

**<u>ගරු සමිත පුංචිහේවා මැතිතුමා</u>**

මම මුලින්ම පුද්ගලිකව සුභ පතනවා සභාපතිතුමාට.පිට පිට 4 වතාවක් තම කොට්ඨාශය ජයග්‍රහණය කරලා මේ වතාවෙ දී සභාපතිවරයෙක් වෙන්න අවස්ථාව ලැබුණ එකට. ඒ වගේම ඡන්ද කොට්ඨාශ 13 න් 10 ක් ජයග්‍රහණය කරපු අපේ සහෝදරවරු ඇතුළු සියලුම සහෝදර මන්ත්‍රීවරුන්ට මම සුභ පතනවා. අපි දේශපාලන පළිගැනීම් කරන්නේ නෑ. අපි 11 දෙනා හොඳ වැඩ වල දී ඔබතුමාට සහයෝගය ලබා දෙනවා. සිලු දෙනාටම සුභ අනාගතයක්.

**<u>ගරු මන්ත්‍රී රුසිත නන්දන මැතිතුමා</u>**

මම මේ වෙලාවේ සභාපතිතුමාට සුභ පතන්න කැමතියි. ඒ වගේම සභාවේ හොඳ යෝජනාවලට අපි අනිවාර්යෙන්ම ඔබතුමා එක්ක හිට ගන්නවා. ඔබතුමාට සහයෝගය ලබා දෙනවා කියමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රී පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා</u>**

මා නියෝජනය කරන රන්තොටුවිල කොට්ඨාශයේ ජනතාවට ස්තූතිවන්ත වෙනවා වැඩි ඡන්දයෙන් මාව ජයග්‍රහණය කරවීම වෙනුවෙන්. ඒ වගේම ජාතික ජන බලවේගයෙන් මට අපේක්ෂකත්වය ලබා දුන්නට මම මේ වෙලාවේ ස්තූතිවන්ත වෙනවා. අපි සියලු දෙනාගේම යුතුකම හා වගකීම තමයි මේ බෙන්තර පුරවරය ඉතා දියුණු තත්ත්වයකට පත් කිරීම. අපිව යම්කිසි බලාපොරොත්තුවක් ඇතිව තමයි ජනතාව පත් කරලා තියෙන්නේ. අපේ යුතුකමක් හා වගකීමක් තමයි ඒ අයගේ බලාපොරොත්තු ඉටු කිරීම. මන්ත්‍රීවරයෙක් විදියට තේරී පත් වූ සියලු දෙනාටම සුභ පතමින් මගේ කතාව අවසන් කරනවා. ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රී විජිත් සම්පත් මැතිතුමා</u>**

ගරු සභාපතිතුමාට ප්‍රථමයෙන් මගේ සුභාශිංසන පළ කරනවා. අපේ කණ්ඩායම් නායක කොඩිතුවක්කු සහෝදරයා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත්, මහ ඌරගහ කොට්ඨාශයෙන් තේරී පත් වූ අනෙකුත් මන්ත්‍රීතුමන්ලා දෙදෙනා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ට මගේ සුභාශිංසන පළ කරනවා අවංක සිතින් ලස්සන බෙන්තරක් හදන්න ශක්තිය ධෛර්යය ලැබෙන්න කියලා. ඒ වගේම මහ ඌරගහ කොට්ඨාශයෙන් අපිව දිනවන්න ඡන්දය ලබා දුන් සියලු දෙනාට මගේ කෘතඥතාවය පළ කරනවා. ඒ වගේම අපිට කණ්ඩායම් නායකත්වය දීලා අපිව මෙහෙයවපු කොඩිතුවක්කු සහෝදරයා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් අපේ සංවිධායකවරුන්ටත් බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා අපිත් එක්ක වැඩ කරලා මහන්සිවෙලා අපිව මේ තැනට ගෙනැල්ලා තියෙන එක සම්බන්ධයෙන්. ඉතිං ඉස්සරහටත් අපි එකට වැඩ කරමු හොඳ බෙන්තරක් හදන්න අවංකව කැපවෙන්න හැමෝටම ශක්තිය ධෛර්යය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා</u>**

බෙන්තර කියන්නේ ඓතිහාසික පුරවරයක්. ඒ ඓතිහාසික පුරවරයේ ජනතාවගේ දියුණුවට බෙන්තර ප්‍රාදේශීය සභාවේ අභිනව සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය අද වැඩ කටයුතු ආරම්භ කිරීම ගැන ඉතාමත් සතුටු වෙනවා. එක්සත් ජාතික පක්ෂයෙන් වැඩිම මනාප අරගෙන පත්වෙලා 8 වෙනි විධායක ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රමුඛත්වයෙන් මම බෙන්තර ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් විදියට පත් වුණා. අපි සියල්ල එකට එකතු වෙලා මේ බෙන්තර ගොඩගමු. ඒ සඳහා අපේ සියලුම සහයෝගය ලබා දෙනවා. ඒ වගේම උප සභාපති විදියට මාව පත් කිරීමට යෝජනා කිරීම පිළිබඳව මම කොඩිතුවක්කු මන්ත්‍රීතුමාට ස්තූතිවෙමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා</u>**

මා නියෝජනය කරන මහ ඌරගහ කොට්ඨාශයේ ජනතාවට මං ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම මේ සභාවේ වැඩිම කාලයක් නියෝජනය කරලා අත්දැකීම් බහුලම සභාපතිවරයා හැටියට එතුමාට හොඳ අවබෝධයක් තියෙනවා. අපි හැමෝම එකතු වෙලා වැඩ කටයුතු කරමු කියන පණිවුඩය මතක් කරමින් මගේ කතාව අවසන් කරනවා.

**<u>ගරු මන්ත්‍රී තිලක් උපුල් මැතිතුමා</u>**

අභියෝග ගොඩක් මැද තමයි මේ සභාවට තේරිලා ආවේ. ඒ වගේම මම පක්ෂයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂයේ මහ ලේකම්තුමාට ජනක කාරියවසම් මැතිතුමාට මේ අවස්ථාවේ විශේෂ ස්තූතියක් පුද කරනවා. ඒ වගේම අපේ බෙන්තර සංවිධායකතුමාටත් මගේ ස්තූතිය පුදකර සිටිනවා මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව. හමගේ කොට්ඨාශයේ මට සහයෝගය ලබා දුන් ජනතාවට ස්තූතිය පුදකරමින් ඔබ සියලු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් බෙන්තර පුරවරයේ සියලු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්භානි මැතිතුමිය</u>**

මම උඩගේ කන්කානම්ගේ මධුභාෂිකා දිල්භානි. මම නියෝජනය කරන්නේ සමගි ජන බලවේගය. ඉඳුරුව ප්‍රදේශයේ සමගි ජන බලවේගයේ ඡන්ද දායකයන්ට මගේ ස්තූතිය පළ කර සිටිනවා. ප්‍රථමයෙන් මා පක්ෂයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වගේම විපක්ෂ නායක ගයන්ත කරුණාතිලක මැතිතුමාට ස්තූතිය පුද කර සිටිනවා. ඒ වගේම හිටපු විපක්ෂ නායක නිලන්ත මැදගොඩ මැතිතුමාටත්, සමගි ජන බලවේගය නියෝජනය කරමින් මෙවර ඡන්දයට ඉදිරිපත් වුණු සියලු සහෝදර සහෝදරියන්ට ද මගේ ස්තූතිය පුද කර සිටිවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, ඔබතුමා ගන්නා හොඳ තීරණවලට මාගේ සහයෝගය දක්වන බවටත් ඒ වගේම පක්ෂයේ ගන්නා ඉදිරි තීරණවලට මාගේ සහයෝගය දක්වන බවටත් ඔබ සැමදෙනා සමඟ සහයෝගයෙන් කටයුතු කරන බවටත් මම ප්‍රකාශ කරනවා. බොහොම ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රී නිස්සංක දේශප්‍රිය මැතිතුමා</u>**

මා ප්‍රථමයෙන්ම මහගොඩ කොට්ඨාශයෙන් ඡන්දය ලබා දුන් සියලු දෙනාටම ස්තූතිවන්ත වෙනවා. මම කොට්ඨාශයෙන් එක් ඡන්දයකින් තමයි පරාද වුණේ. උප සභාපතිතුමා ලැයිස්තු මන්ත්‍රීවරයෙක් විදියට මාව පත් කිරීම පිළිබඳ මං ස්තූතිවන්ත වෙනවා. ඒ අතරේ සභාවේ සභාවේ වඩාත් හොඳ වැඩවලට සභාපතිතුමාට සහයෝගය දක්වනවා. ස්තූතියි.

<u>ගරු මන්ත්‍රී සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා</u>

ප්‍රථමයෙන් මා සුභ පතනවා ගරු සභාපතිතුමාට. මෙවර මැතිවරණයේ දී ප්‍රධාන දේශපාලන පක්ෂ නියෝජනය කරන කණ්ඩායම් අතර ස්වාධීන කණ්ඩායම් සඳහා මන්ත්‍රී ධූර 4 ක් ලැබිලා තියෙනවා. ගරු සභාපතිතුමාට ස්වාධීන කණ්ඩායමක් විදියට නිවැරදි දේට මහ පෙන්වීමට අවශ්‍ය සහයෝගය හා ශක්තිය ලබා දෙනවා. මං නියෝජනය කරපු ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායක බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති ගයාන් සිරිමාන්න මැතිතුමාට මේ අවස්ථාවේ ස්තූතිවන්ත වෙනවා. සභාවට තේරී පත් වූ අනෙකුත් අපේක්ෂකයන් සියලු දෙනාටත් සුභ පතනවා. ඒ වගේම අපට ඡන්දය ලබා දුන් ජනතාවටත් ස්තූතිවන්ත වෙමින් සියලුදෙනාට සහයෝගයෙන් මේ සභාව ගොඩනගන්න ආරාධනා කරනවා. ස්තූතියි.

<u>ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>

මම සතුටු වෙනවා හැම දෙනාම ධනාත්මක මට්ටමේ සාධනීය අදහස් ඉදිරිපත් කරපු එකට. මේ සභාව ආරම්භයේ සිටම මන්ත්‍රීවරයෙක් විදියට නොවුණත් විවිධ කටයුතු වල දී විවිධ ආකාරයෙන් මම සහයෝගය දක්වලා තියෙනවා. ඒ වගේම ගයාන් සිරිමාන්න මැතිතුමාට මං ස්තූතිවන්ත වෙනවා මට මේ අවස්ථාව ලබා දුන්නට. වෙන කණ්ඩායම් නායකයෙක් නම් ඒ අවස්ථාව ලබා ගනී. නමුත් එතුමා කැප කිරීමක් කරලා මට ඒ අවස්ථාව ලබා දුන්නා. විවිධ හැකියාවන්වලින් සමන්විත දක්ෂයෝ පිරිසක් මේ සභාවට පත් වෙලා තියෙනවා. අපි හැමෝම එකතු වෙලා

<u>ගරු  සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙතෙක් වෙලා සභාවේ රැඳී සිටිමින් සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය දැක්වූ උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ 22 දෙදෙනාටම ස්තූතිවන්ත වෙමින් සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. සියලු දෙනාටම ස්තූතියි.

ප.ව. 13.15 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව